**පුත්තලම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2005 සහ 2014 වර්ෂවල ආධාර ලෙස ලැබුණු රු.4,211,500 ක් වටිනා වාහන 04 ක් ස්ථාවර වත්කම් යටතේ ද එකතුව රු.2,326,850 ක ණය හිමියන්, ණයහිමි ගිණුම යටතේ ද සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.2,197,367 ක සහා සේවක වැටුප් ප්‍රතිපූර්ණ ලැබිය යුතු ගිණුම් යටතේ ද ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මදුරන්කුලිය සතිපොල වෙනුවෙන් ලබාගන්නා ලද ණය මුදලේ 2014 පළමු හා දෙවන කාර්තු සඳහා ගෙවන ලද රු.50,660 ක පොලී, පොලී ගිණුමට ගිණුම්ගත කර නොතිබීම නිසා එම ගිණුම හා ණය ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**--------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන් 04 ක ශේෂවල එකතුව රු.3,301,872 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ඒවායේ එකතුව රු.3,607,335 ක් වීමෙන් රු.305,463 ක වෙනසක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.19,810,505 ක් වුවද, එදිනට එම අරමුදලේ ශේෂ තහවුරු කිරීමේ ලිපිය අනුව එය රු.30,941,094 ක් ව තිබුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

**------------------**

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.10,435,712 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.9,650,175 ක් විය. වර්ෂ ගණනාවක සිට අවලව පවතින ජංගම වත්කම්වල අගය රු.846,188 ක් විය.

**1.3.4 අයවීමට ඇති සේවක ණය**

**----------------------------**

අයවිම හිඟහිට තිබූ සේවක ණය රු.3,240,743 ක් වූ අතර, එයින් සේවය හැරයාම, ස්ථාන මාරුවීම, මියයාම හා විශ්‍රාම ගිය සේවකයින් 14 දෙනෙකුගෙන් රු.46,669 ක් වසර ගණනාවක සිට අයනොවී පැවතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------**

ගිණුම් විෂයයන් 03 කට අදාලව ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 23,647,411 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3. 6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**-----------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායම් විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණු අතර පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ ඇති ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු නොගෙවා පැහැර හරින තැනැත්තන් සම්බන්ධයෙන් අවශ්‍ය

නීතිමය පියවරද ගෙන නොතිබුණි. තවද පනතේ 158 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් වංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වසරේ සිට පැවත එන වසර 02 ක් ඉක්මවූ රු.9,196,130 ක් වටිනා තැන්පතු 20 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (1) (2) (3) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,401,063 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,978,645 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ ලැබී තිබුණු, පිළිවෙලින් රු.35,900,085 ක් හා රු.9,159,410 ක් වූ මූලධන ආධාර හා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ පිළිවෙලින් රු.35,446,466 ක හා රු.13,859,585 ක මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ රු.2,947,444 ක හා ඉකුත් වර්ෂයේ රු.2,721,530 ක ඌනතාවයක් ඇති වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල තවදුරටත් රු.225,914 ක පිරිහීමක් සිදුව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ පෞද්ගලික පඩිනඩි හැර අනෙකුත් පුනරාවර්තන වියදම් විෂයයන්හි ඇස්තමේන්තු වටිනාකම වූ රුපියල් මිලියන 20 ඉක්මවා රුපියල් මිලියන 4.7 ක් වැයකර තිබූ අතර, එම ඉක්මවීම ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ දල වශයෙන් සියයට 23 ක් විය. වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදිත මුදල වූ රුපියල් මිලියන 19.1 ඉක්මවා රුපියල් මිලියන 16.3 ක් ද වශයෙන් වැය කර තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. |
| (අ) | වරිපනම් හා බදු | 1,480 | 1,292 | 3,259 | 3,225 | 1,141 | 2,801 |
| (ආ) | බදුකුලී, කඩකුලී | 10,000 | 8,832 | 4,785 | 976 | 5,733 | 2,848 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 4,500 | 4,336 | 904 | 6,975 | 4,059 | 908 |

### 2.3.2 <u>උසාවි දඩ</u>

2014 ජනවාරි සිට ජුලි මස දක්වා උසාවි දඩ වශයෙන් රු.5,538,384 ක් සභාවට ලැබී තිබුණි. 2014 අගෝස්තු සිට දෙසැම්බර් අවසානය දක්වා කාලසීමාව වෙනුවෙන් උසාවි දඩ මුදල් ලැබී නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් ලෙස රු.12,000,000 ක් ඇස්තමේන්තු කර ගිණුම්ගත කර තිබුණි.

### 2.3.3 <u>මුද්දර ගාස්තු</u>

2014 ජනවාරි සිට ජුනි මස දක්වා කාලයට අදාලව මුද්දර ගාස්තු වශයෙන් රු.9,377,456 ක මුදලක් සභාවට ලැබී තිබුණි. ප්‍රධාන ලේකම් විසින් වැරදීමකින් එකම කාලයකට අදාලව රු.4,688,728 බැගින් දෙවරක් මුද්දර ගාස්තු එවා තිබුණද, සභාව විසින් ඒ බව ප්‍රධාන ලේකම්ට වාර්තා කිරීමට පියවර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, 2014 වර්ෂයට අදාළව අයවිය යුතු මුද්දර ගාස්තු ලෙස සභාව විසින් රු.7,000,000 ක මුදලක් ඇස්තමේන්තු කර ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, සභාව ඇස්තමේන්තු කල මුදලට වඩා වැඩි මුදලක් වර්ෂයේ මුල් අඩවසර තුලදී ලැබී තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

--------------------

සභාවේ අංක RS – 1556 දරන මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය 2009 සිට 2014 වර්ෂයේ අවසානය දක්වා කුලියට දීමෙන් රු.725,971 ක කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 දේපල බදු

---------------

සභාව සතු දේපල 12 ක් 2014 වර්ෂයට බදු දීමට කටයුතු නොකිරීම තුළ අවම ලංසුව අනුව රු.225,480 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 09 කට ආසන්න කාලයක් වරිපනම් තක්සේරුවක් සිදුකිරීමට සභාව ක්‍රියාකර නොතිබුණි.

(ආ) වයඹ ආණ්ඩුකාරවරයාගේ සහ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ තායිලන්ත සංචාරය වෙනුවෙන් සංයුක්ත දීමනා ලෙස රු.161,587 ක් ගෙවා තිබුණි.

**3.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

**------------------------------------------------**

සභාව සතු රු.4,467,800 ක් වටිනා වත්කම් වර්ෂ කිහිපයක් තිස්සේ නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

**4. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන පාලනය